# ප්‍රසිද්ධ වෙන්දේසියයි!

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ භාවිතයෙන් ඉවත් කරන ලද පහත සඳහන් ද්‍රව්‍ය 2024.01.16 දින පෙ.ව. 10.00ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

| අනු අංකය | භාවිතයෙන් ඉවත් කරන ලද ද්‍රව්‍ය |
|---|---|
| 01 | වායු සමීකරණ යන්ත්‍ර හා ඒවායේ කොටස් |
| 02 | මුද්‍රණ යන්ත්‍ර හා එහි කොටස් |
| 03 | අබලි ඇලුමිනියම් කොටස් |
| 04 | යකඩ |
| 05 | විදුලි පංකා කොටස් |
| 06 | තහඩු |
| 07 | ඉවතලන ප්ලාස්ටික් හා ප්ලාස්ටික් හිස් කෑන් |
| 08 | ටයර් |
| 09 | ශීතකරණ (01) |

02. මෙම අබලි ද්‍රව්‍ය, අංක. 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08 යන ලිපිනයෙහි පිහිටි රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තු පරිශ්‍රයේ ගබඩා කර ඇති අතර, ඒවා 2024.01.03 දින සිට 2024.01.13 වන දින දක්වා පෙ.ව.9.00 සිට ප.ව. 3.30 දක්වා කාලය තුළ පරීක්ෂා කර බැලිය හැකිය. (ඉරිදා සහ රජයේ ප්‍රසිද්ධ නිවාඩු දිනයන් හැර)

03. 2024.01.16 දින පෙ.ව. 10.00ට අදාළ වෙන්දේසිය ආරම්භ කෙරෙන අතර, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මිළ නියම කිරීමේ කමිටුව මඟින් මෙම එක් එක් ද්‍රව්‍ය සඳහා නියම කර ඇති අවම මිලෙන් ලංසු තැබීම ආරම්භ වනු ඇත.

04. කොන්දේසි

- වෙන්දේසියේ දී නියම වන උපරිම මිලට අදාල භාණ්ඩ අලෙවි කෙරෙන අතර ගැණුම්කරු එම අවස්ථාවේදීම නියමිත මුදල රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ සරප් අංශය වෙත ගෙවා නියමිත කුවිතාන්සිය ලබා ගත යුතුය.
- භාණ්ඩ වෙන්දේසි කළ පසුව භාණ්ඩ වල වගකීම මිලදී ගනු ලබන පුද්ගලයා සතු වන අතර එම භාණ්ඩ දෙපාර්තමේන්තු පරිශ්‍රයෙන් නියම කරනු ලබන කාල සීමාව ඇතුළත ඉවත් කර ගත යුතුය. එසේ නැතහොත් ඉතිරි වන භාණ්ඩ ඉවත් කිරීම වෙනුවෙන් රජයට දැරීමට සිදුවන පිරිවැය අදාල ගැණුම්කරුගෙන් අය කර ගනු ලැබේ.
- වෙන්දේසිය පැවති දින සිට රජයේ වැඩ කරන දින දෙකක් ඇතුළත අදාල භාණ්ඩ දෙපාර්තමේන්තු පරිශ්‍රයෙන් ඉවත් කර ගත යුතු අතර ප්‍රමාද වන සෑම දිනක් සඳහාම ප්‍රමාද ගාස්තු වශයෙන් රු.100/-ක් අය කරනු ඇත.
- මෙම වෙන්දේසිය සම්බන්ධ සියලු බලතල රජයේ මුද්‍රණාලයාධිපති සතුවන අතර, රජයේ මුද්‍රණාලයාධිපති විසින් අවස්ථානුකූලව උද්ගතවන තත්වයන්හී දී ගනු ලබන තීරණය අවසන් තීරණය වේ.

මේ සම්බන්ධව වැඩිදුර විස්තර www.documents.gov.lk වෙබ් අඩවියට පිවිසීමෙන් ලබා ගත හැක.

ගංගානි ලියනගේ
රජයේ මුද්‍රණාලයාධිපති

2024.01.02 දින
කොළඹ 08
දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවතේ
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේදීය.